එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව

නිල ප්‍රකාශක කාර්යාලය

තොරතුරු පත්‍රිකාව

2020 ඔක්තෝබර් 27

## ඉන්දු-ශාන්තිකර සබඳතා වැඩිදියුණු කිරීම සඳහා පොම්පෙඕ ලේකම්තුමා ශ්‍රී ලංකාවට සංචාරය කරයි

"*අප අතර සබඳතාවය පොදු ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් මත පදනම් වී ඇති අතර, ශ්‍රී ලංකාවේ ප්‍රබල ප්‍රජාතන්ත්‍රවාදය හා ස්වෛරීත්වය සඳහා එක්සත් ජනපදයේ ස්ථිර සහයෝගය ලැබේ.*"

– එ.ජ. රාජ්‍ය ලේකම් මයිකල් ආර්. පොම්පෙඕ, 2020 පෙබරවාරි 3

එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම් මයිකල් ආර්. පොම්පෙඕ මහතා 2020 ඔක්තෝබර් මස 27-28 යන දිනවල ශ්‍රී ලංකාවේ කොළඹ නගරයට සංචාරය කරනු ඇති අතර, රාජ්‍ය ලේකම්තුමා එහිදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සහ දිනේෂ් ගුණවර්ධන විදේශ අමාත්‍යතුමා හමුවනු ඇත. ආරක්ෂාව සහ ආර්ථික ගැටළු සම්බන්ධයෙන් ඉන්දු-ශාන්තිකර කලාපයේ හවුල්කරුවකු වශයෙන් ශ්‍රී ලංකාවේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් එහිදී ලේකම්තුමා විසින් අවධානය යොමුකරනු ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය සඳහා අපගේ ඇති කැපවීම අවධාරණය කිරීමට ද පාලන හා ප්‍රතිසන්ධාන ප්‍රමුඛතා සම්බන්ධයෙන් ප්‍රගතිය ලබාගැනීමට දිරිගැන්වීමට ද එය අවස්ථාවක් කරගනු ඇත.

## එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව: ඉන්දු-ශාන්තිකර කලාපයේ වැදගත් හවුල්කාරීත්වයකි

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, නීතියේ ආධිපත්‍ය හා ආගමික නිදහස ඇතුළු මානව හිමිකම් සඳහා ගරුකිරීම සම්බන්ධයෙන් වන පොදු වටිනාකම් මත සහ නීති-පදනම් කරගත් ජාත්‍යන්තර පර්යායක් තුළ සියළු රටවලට සමෘද්ධිමත්බව ළඟා කරගත හැකි විවෘත වූත් ඔරොත්තුදීමේ හැකියාව සහිත වූත් ඉන්දු-ශාන්තිකර කලාපයක් සඳහා වන එකඟවීම මත එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ හවුල්කාරීත්වය පදනම් වී ඇත.
- ඉන්දු-ශාන්තිකර කලාපයේ ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබිඹුවන පරිදි සහ එම සුවිශේෂී පිහිටීමත් සමගින් ලැබී ඇති අවස්ථාවන් ගෙන් එල නෙලාගත හැකි

පරිදි, ශ්‍රී ලංකාවේ නායකයින් රටේ කලාපීය කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ගේ දැක්ම ගෙනහැර දක්වා තිබේ.

- ප්‍රතිසන්ධානය සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම අපි සාදරයෙන් පිළිගනිමු. මෙම කැපවීම් සඳහා සහය පිණිස කාලෝචිත පරිදි දරන වෑයම් සියළුම ශ්‍රී ලාංකිකයින් සඳහා සාමකාමී හා සමෘද්ධිමත් අනාගතයක් තහවුරු කරගැනීමට උපකාරී වනු ඇත.

## විනිවිදභාවයෙන් යුතුව ලබාදුන් ආධාර පිළිබඳ අතීත තොරතුරු

- ශ්‍රී ලංකාව 1948දී නිදහස ලැබූ තැන් පටන් මේ දක්වාම එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට සංවර්ධන ආධාර, ආරක්ෂක සහයෝගීතාවය, අධ්‍යාපන හුවමාරු සහ අන්‍යොන්‍යවශයෙන් ප්‍රතිලාභ ගෙනදෙන වෙළඳ කටයුතු හා ආයෝජන ලබාදී තිබේ.
- ශ්‍රී ලංකාවට අප ලබාදෙන උපකාර ණය වශයෙන් නොව ප්‍රදාන වශයෙන් ලබාදෙන අතර, ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍ය ප්‍රවර්ධනයටත් ඉහළ ගුණාත්මකබවකින් යුත්, වාණිජ ශක්‍යතාවය සහිත හා තිරසාර ව්‍යාපෘති හා පෞද්ගලික-ක්ෂේත්‍රයේ ආයෝජන ආකර්ෂණය කරගැනීමටත් ඒවා උපකාරී වේ.
- ජීවත්ව සිටින 2019 පාස්කු බෝම්බ ප්‍රහාර සඳහා වරදකරුවන් යුක්තිය ඉදිරියට පැමිණවීම සඳහා, ත්‍රස්තවාදීන්ගේ ගමනාගමනයන්ට බාධාකිරීම සඳහා සහ ත්‍රස්ත විරෝධී මූල්‍යකරණ නඩුපැවරීම්වලට සහයදීම සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් අළුතින් ත්‍රස්ත විරෝධී ආධාර වැඩසටහන් යටතේ ඩොලර් මිලියන 1.8ක් ශ්‍රී ලංකාවට ලබාදෙනු ලැබේ.
- ගෙවීගිය 20 වසර තුළ එක්සත් ජනපදය සෞඛ්‍ය ආධාර වශයෙන් ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 26ක් ඉක්මවන ප්‍රමාණයක් ලබාදී තිබේ.
- එක්සත් ජනපදය කෝවිඩ්-19 සඳහා ආධාර වශයෙන් ඩොලර් මිලියන 6ක් ලබාදී තිබේ.
- සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ආයතනය (U.S. Agency for International Development) සැප්තැම්බර් මාසයේදී, ශ්‍රී ලංකාවට අළුත් වෙන්ටිලේටර් යන්ත්‍ර 200ක් පරිත්‍යාග කරන ලදී.
- පශ්චාත් යුධ පිපිරුම් ද්‍රව්‍ය සහ බිම්බෝම්බ උපද්‍රවයෙන් අතමිදීම සඳහා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 74 ඉක්මවන ප්‍රමාණයක් ලබාදී තිබේ.
- විදේශ ආධාර හරහා සහ රටේ විවිධ සංවිධාන සමගින් ඇතිකරගන්නා ඍජු හවුල්කාරීත්ව හරහා අපි අඛණ්ඩව ශ්‍රී ලංකාවේ ආර්ථික සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනයට සහය දෙන්නෙමු. ශ්‍රී ලංකාව නිදහස ලැබීමේ පටන් මෙතෙක් අපි බිලියන 2 ඉක්මවන ආධාර ප්‍රමාණයක් ලබාදෙමින් රටට උපකාර කර ඇත්තෙමු.

## ඉන්දු-ශාන්තිකරයේ ආරක්ෂාව පිළිබඳ ශක්තිමත් සහයෝගීතාවය

- දෙරටේම කුසලතා සහ සුසංයෝගී ක්‍රියාකාරීත්වය සංවර්ධනය කිරීමට හේතු වූ විවිධාකාර හවුල් අභ්‍යාස සහ පුහුණු එක්සත් ජනපද-ශ්‍රී ලංකා ආරක්ෂක සහයෝගීතාවයට ඇතුළත් වේ. මෙම සහයෝගීතාවය තුළ, මානුෂීය ආධාර හා ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම ද සමුද්‍ර බලප්‍රදේශ පිළිබඳ දැනුවත්භාවය ද ඇතුළු අප දෙරටේම අන්‍යෝන්‍ය ආරක්ෂා ලැදියාවන් ආමන්ත්‍රණය කරයි.
- තාවකාලික භාණ්ඩ පැවරුම් මුලපිරීම (Temporary Cargo Transfer Initiative) යටතේ එක්සත් ජනපදය, ඉන්දු-ශාන්තිකරයේ කාර්යබහුල මුහුදු මාර්ග හරහා නිතර ගමන්ගන්නා ඇමරිකානු නෞකා සඳහා ශ්‍රී ලංකාවෙන් සේවා හා භාණ්ඩ ලබාගනියි.
- 2018 අගෝස්තු මාසයේ දී අපි එක්සත් ජනපදයේ වෙරළාරක්ෂක කටයුතු සඳහා භාවිතා කළ නෞකාවක් ශ්‍රී ලංකා නාවික හමුදාවට පරිත්‍යාග කළෙමු. ශ්‍රී ලංකා නැව් බලඇණියේ විශාලතම නෞකාව වන එම SLNS ගජබාහු නෞකාව, දේශීය මුහුදු තීරය සහ විශේෂ ආර්ථික කලාපය තුළ ආරක්ෂක මුර සංචාරවල නිරතවීමට නාවික හමුදාවට ඇති හැකියාව වර්ධනය කිරීමට හේතු වී තිබේ.
- 2020 වසන්ත කාලයේදී SLNS ගජබාහු නෞකාව සහ, එක්සත් ජනපදෙයෙන්ම පරිත්‍යාග කළ SLNS සමුදුර යන තවත් නෞකාවක් ඩොලර් මිලියන 33ක වටිනාකමකින් යුත් හෙරොයින් සහ ක්‍රිස්ටල් මෙත්ඇම්ෆෙටමින් තොගයක් අල්ලාගැනීමට සම්බන්ධ විය.

## දීර්ඝ කාලයක සිට පවතින වෙළඳ සබඳතා

- ශ්‍රී ලංකාවේ විශාලතම තනි අපනයන වෙළඳපල සහ ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ හවුල්කරු වන්නේ එක්සත් ජනපදයයි.
- 2019 දී, ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 2.7ක් ඉක්මවන ප්‍රමාණයක භාණ්ඩ එක්සත් ජනපදයට අපනයනය කළ අතර, ඉන් ඩොලර් බිලියන 1.8ක්ම නිමි ඇඟළුම් විය.
- එක්සත් ජනපදය ද, ඇමරිකාවේ නිෂ්පාදිත භාණ්ඩ සඳහා වැදගත් පාරිභෝගිකයකු වශයෙන් ශ්‍රී ලංකාව සලකනු ලැබේ. උසස් යන්ත්‍රෝපකරණවල සිට කෘෂි නිෂ්පාදන දක්වා ශ්‍රී ලංකා ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර සඳහා එක්සත් ජනපදයෙන් භාණ්ඩ අපනයනය කරනු ලැබේ. එක්සත් ජනපද රජය සහ ශ්‍රී ලංකා රජය යන දෙපාර්ශවයම ශ්‍රී ලංකාවට එවන ඇමරිකානු අපනයන සහ ආයෝජන වර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.
- ශ්‍රී ලංකාව සමගින් ව්‍යාපර කටයුතුවල නිරතවන ඇමරිකානු සමාගම්වලට එක්සත් ජනපදය රජයෙන් සහය ලබාදෙන්නේ ආඩම්බරයෙනි. සියළුදෙනාට සාධාරණ සහ විනිවිදභාවයෙන් යුත් ආර්ථික තත්වයන් ශ්‍රී ලංකාවේ නිර්මාණය කරන ප්‍රතිපත්ති හා පරිචයන් දිරිගැන්වීමෙහි අපි අඛණ්ඩව නිරත වන්නෙමු.